**ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය - 2022**

--------------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රිය දායකයන් හා ගොවි විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් වගකීම කාලානුරූපීව සිදුකරනු ලබන ආයුගණක තක්සේරුව මගින් ගණනය කළ යුතු වුවද 2007 වර්ෂයෙන් පසු දිගින් දිගටම ආයුගණක තක්සේරුවක් සිදු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා විශ්‍රාම වැටුප් වගකීම ගණනය කර තිබුණු අතර එසේ ගණනය කරන ලද විශ්‍රාම වැටුප් වගකීම රු.82,435,153,268 ක් විය. තවද අරමුදල විසින් මෙම බැදීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකර නොතිබුණි. | 2007 වර්ෂයේදී ආයුගණක තක්සේරුව මත පදනම්ව විශ්‍රාම වැටුප් වගකීම ගිණුම්ගත කර එම පැරණි යෝජනා ක්‍රමයට නව බඳවාගැනීම් සිදු කර නොමැත. නව යෝජනා ක්‍රමයක් ස්ථාපනය කර නව බඳවාගැනීම් සිදු කරනු ලැබේ. නව ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආයුගණක තක්සේරුව ලබාගන්නා අවස්ථාවේදී පැරණි යෝජනා ක්‍රමයේද ආයුගණක තක්සේරුව ලබාගැනීම සිදුකරනු ඇත. | විශ්‍රාම වැටුප් වගකීම කාලානුරූපීව සිදුකරනු ලබන ආයුගණක තක්සේරුව මගින් ගණනය කළ යුතු අතර බැදීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයක් පවත්වාගෙන යා යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සක්‍රිය දායකයින්ගෙන්, ගිණුම් වර්ෂය සඳහා ලැබිය යුතු දායක මුදලේ වටිනාකම හඳුනාගැනීමට හැකිවන පරිදි විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය සඳහා බැඳුන දිනය සහ හිමිකම්පාන දිනය ඇතුළත් දායකයින්ගේ නාමලේඛනය වාරික ලැබීම් ඇතුළත් කරමින් සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන නොයාම නිසා දායකයින්ගෙන් ලද ආදායම උපචිත පදනම වෙනුවට මුදල් පදනමට රු.13,420,221 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | දායකයින්ගේ තොරතුරු පරිගණක පද්ධතිය තුළින් ලබාගත හැක. පසු වාරික පරිගණක ගත කිරීමේ ප්‍රමාදයන් සිදුවී ඇති බැවින් අවලංගු වූ හා අක්‍රිය වූ දායකයින් පද්ධතිය තුළින් ලබාගැනීමට අපහසු වී ඇත. එම නිසා පසු වාරික ස්වයංක්‍රීයව පරිගණකගත කිරීම සඳහා වැඩපිළිවෙලක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | දායකයින්ගේ නාම ලේඛන යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද රු.3,968,000,000 ක මුදලින් රු.3,918,881,123 ක් ගෙවීම් කිරීමෙන් පසු ඉතිරි මුදල වූ රු.49,118,877 ක් නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු අතර එය ආපසු ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගොවි විශ්‍රාම වැටුප් වියදම රු.4,053,000,000 ක් වූ අතර, භාණ්ඩාගාරයෙන් ලද රු.3,998,000,000 ක් වූ මුදල් සියල්ල ගෙවා ඇත. ආදායම් ප්‍රකාශය තුළ දැක්වෙන්නේ එම මුළු වියදමෙන් දායකයින් විසින් ලබානොගෙන ආපසු ලැබුණු මුදල් අඩුකළ පසු අගය වේ. මේ අනුව භාණ්ඩාගාරයට ගෙවිය යුතු ශේෂයක් නොමැත. | දායකයින් වෙත නොගෙවූ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම්වලින් හිමිකම් නොපෑ රු.167,470,484 ක් ගොවීන්ට ආපසු ගෙවිය යුතු බැරකමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකර යෝජනාක්‍රමයේ ආදායම ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ රු.167,470,484 ක හිමිකම් නොපෑ විශ්‍රාම වැටුප් මුදල, විශ්‍රාම වැටුප් වියදමින් අඩුකර පෙන්වා ඇත. දීර්ඝකාලීනව විශ්‍රාම වැටුප් ලබා නොගන්නා දායකයින්ගේ විශ්‍රාම වැටුප් අත්හිටුවීමට කටයුතු කරනු ලැබේ. එම නිසා මෙම හිමිකම් නොපෑ මුදල ලැබිය යුතු විශ්‍රාම වැටුපක් ලෙස ගිණුම්ගත කර නොමැත. | ලබා නොගත් විශ්‍රාම වැටුප් ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | 2019 ජනවාරි සිට 2022 දෙසැම්බර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රු.4,435,400 ක හිමිකම් නොපාන ලද ශුද්ධ වාරික මුදල් සහ මාසික බෙලහීන ගෙවීම් සඳහා වූ චෙක්පත් 612 ක් මු.රෙ.396(ඇ)(iii) ප්‍රකාර ගෙවීමට ඇති ණයක් වශයෙන් සටහන් නොකර, ඒ ඒ වර්ෂවලදී ආදායමට ගෙන තිබුණි. | කාලය ඉකුත්වන චෙක්පත් ලේඛනගත කර ආදායමට ගැනීම සිදු කරනු ලබන අතර, ලැබෙන ඉල්ලීම් අනුව නැවත චෙක්පත් නිකුත් කරනු ලබයි. | හිමිකම් නොපාන විශ්‍රාම වැටුප් ගෙවිය යුතු ණය ශේෂ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි පරිපාලන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.190,000,000 ක් ගොවි විශ්‍රාම වැටුප් අරමුදලෙහි බැංකු ගිණුමට බැර නොකර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමට බැර කර එයින් වියදම් දරා, ජංගම ගිණුමක් මගින් එම ගනුදෙනු අරමුදලෙහි ලෙජරයට සටහන් කර තිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් ලබාදීම සඳහා ලැයිස්තුගත කර ඇති ගිණුම වනුයේ ලංකා බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාවේ මණ්ඩලය සතු 164667 දරන ගිණුමය. එම ගිණුමට ලැබෙන අදාළ මුදල් ජංගම ගිණුම හරහා කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමයේ සිට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරු කරනු ලැබේ. | භාණ්ඩාගාර ප්‍රතිපාදනයන් යෝජනා ක්‍රමයේ බැංකු ගිණුමට ගෙන්වාගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ දී මෙම යෝජනා ක්‍රමයට අදාළව නීතිමය ගනුදෙනු නොතිබියදී කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නීති වියදමින් සියයට 60 කට සමාන රු.1,348,623 ක් මෙම යෝජනා ක්‍රමයේ නීති වියදම ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම ප්‍රතිශතය තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි. | මණ්ඩලයේ නීති වියදමින් සියයට 60 ක ප්‍රතිශතයක් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට ගිණුම්ගත කර ඇත. නමුත් විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි නීති වියදම නැවත සමාලෝචනය කර මෙම යෝජනා ක්‍රමයේ නීති වියදම් පමණක් සටහන් කිරීමට කටයුතු කරනු ලබන අතර, වියදම් බෙදීමට අදාළ කරගන්නා වියදම් ගිණුම් සියල්ල සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | යෝජනාක්‍රමයට අදාළ වියදම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යන ගිණුම් ඒකක තුනම එක්ව ක්‍රියාත්මකව තිබුණත්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පරිපාලන වියදමින් සියයට 50 ක් සහ අනෙකුත් වියදම්වලින් සියයට 20 සිට සියයට 50 ක් දක්වා වූ ඉහළ ප්‍රතිශතයන් ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අන්තර්ග්‍රහණය කර තිබුණි. එම අනුපාතවල සාධාරණත්වය පරීක්ෂා කිරීම සඳහා අනුපාත තීරණය කළ පදනම හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලයේ සිටින සේවක මණ්ඩලය පොදුවේ සේවයේ යෙදෙන බැවින් මෙසේ අනුපාතය නිර්ණය කර ඇත. නමුත් ඉදිරියේදී මෙම අනුපාතයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගනිමින් සමාලෝචනය කිරීමට කටයුතු කෙරේ. | වියදම අන්තර්ග්‍රහණ අනුපාතය හෙළිදරව් කළ යුතුය. |

**1.5.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජනාක්‍රමයේ මුළු වත්කම් රු.1,516,033,327 ක් සහ මුළු වගකීම් රු.87,508,723,633 ක් වූ අතර වත්කම් ඉක්මවූ වගකීම් රු.85,992,690,306 ක් විය. මෙම අවාසිදායක තත්ත්වය යෝජනාක්‍රමයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි අහිතකර ලෙස බලපා තිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් වගකීම වාර්ෂිකව වැඩිවන අතර, යෝජනා ක්‍රමය තුළ ආයෝජන නොමැතිකමත් මෙම යෝජනා ක්‍රමයේ වාරික මුදල් වැඩිකිරීමකින් තොරව අවස්ථා කිහිපයකදී රාජ්‍ය ප්‍රතිපත්ති නිසා ප්‍රතිලාභ වැඩිකිරීම හේතුවෙන් මෙම තත්වය උද්ගත වී ඇති අතර, සෑම වර්ෂයකදීම රජයේ අයවැය මගින් මුදල් වෙන්කර ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරගෙන යනු ලබයි. | යෝජනා ක්‍රමය සක්‍රිය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැපැල් දෙපාර්තමේන්තුවේ දිසා ගිණුම් කාර්යාලවලින් ආපසු ගෙන්වා ගැනීමට ඇති හිමිකම් නොපෑ රු.47,102,835 ක විශ්‍රාම වැටුප් මුදලෙහි නිවැරදිතාවය පරීක්ෂා කිරීමට හැකි අයුරින් මණ්ඩලය විසින් පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තැපැල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදු කරනු ලබයි. නොගෙවූ විශ්‍රාම වැටුප අදාළ මාසයට පසු මාසයේ 10 වන දිනට ප්‍රථම මණ්ඩලය වෙත එවීමට කටයුතු කළ යුතුය. කොරෝනා වසංගත තත්ත්වය හා අර්බුදකාරී තත්ත්වය මත යම් ප්‍රමාදයන් සිදු වුවද මේ වනවිට එම ප්‍රමාදයන් මඟහරවා ගැනිමට කටයුතු කර ඇත. නියමිත දින වකවානු තුළ නොගෙවූ විශ්‍රාම වැටුප් ලේඛන මණ්ඩලය වෙත එවන ලෙස දිසාගණකාධිකාරීවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | හිමිකම් නොපෑ මුදල් පිළිබඳ තොරතුරු සම්පූර්ණව සහ යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **1.6.1** 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත | | | |
| (අ) 6(1)උප වගන්තිය | දායකයෙකු තම වයස අවුරුදු 60 වූ විට විශ්‍රාම වැටුපකට හිමිකම් ලැබිය යුතු වුවත් මෙම යෝජනාක්‍රමයේ | | |
| | (i) විශ්‍රාම වැටුප් අයදුම්පත් ලබා ගැනීමට සහ ඉල්ලුම් කළ යුතු නියමිත දිනයන් පිළිබඳ ඔවුන් දැනුවත් කිරීමට සහ අයදුම්පත් ගෙන්වා ගැනීමට ක්‍රමවේදයක් නොතිබුණි. | අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන්ගේ විස්තර දිස්ත්‍රික් කාර්යාල සඳහා යොමු කරන අතර, ඉදිරියේදී විද්‍යුත් තැපැල මගින් හා SMS පණිවුඩ මගින් ගොවීන් දැනුවත් කිරීමට අපේක්ෂා කෙරේ. මෙයට අමතරව ගොවිජන සේවා මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරීම් ගොවිජනතාව වෙත ගෙනයාමට කටයුතු කරනු ලැබේ. | විශ්‍රාම වැටුප් අයදුම්පත් ලබා ගැනීමට පහසු ක්‍රමවේදයක් සැකසිය යුතුය. |
| | (ii) නියමිත වයස සම්පූර්ණ වන ගොවීන් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන්, ප්‍රතිලාභියා විසින්ම විශ්‍රාම ප්‍රතිලාභ අයදුම් පත්‍රය ඉදිරිපත් කළයුතු වීම නිසා ප්‍රතිලාභියා රෝහල්ගතවී හෝ නිවසේ එක්තැන්වී ප්‍රතිකාර ලබා ගැනීම, දායක මුදල් සටහන් පොත අස්ථානගත වී තිබීම, දායක මුදල් සටහන් පොත නොමැතිව මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් කළ නොහැකි වීම වැනි හේතු නිසා අයදුම්පත් නියමිත දිනට ඉදිරිපත් නොකිරීමේ ප්‍රමාදය නිසා වූ අලාභය ඔහු විසින්ම දරාගත යුතුවිය. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ ගොවීන් දැනුවත් කිරීම සඳහා ඔවුන් විසින් ලබාදී ඇති ලිපිනයන් වෙත තැපැල්පත් යොමු කර ඔවුන් දැනුවත් කිරීමටත්, පුවත්පත් දැන්වීම් මගින් ගොවීන් දැනුවත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. | නියමිත වයස සම්පූර්ණ වන ගොවීන් හඳුනාගැනීමේ ක්‍රමවේදයක් සැකසිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (iii) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 4 ක ගොවීන් 12 දෙනෙකු සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී වාර මුදල් ආපසු ගෙවීමේදී අවුරුදු 2 සිට අවුරුදු 10 දක්වා කාලයක් ප්‍රමාදව පැවතීම සහ නියමිත වයස සම්පූර්ණ වූ දින සිට මාස 10 ත් වර්ෂ 9 ත් අතර කාලයක් විශ්‍රාම වැටුප ප්‍රදානය ප්‍රමාද කළ අවස්ථා නිරීක්ෂණය විය. | දිස්ත්‍රික් කාර්යාල සඳහා ඉදිරිපත් කරන අයදුම්පත් සඳහා ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප් ලබා දීමට අවශ්‍ය උපදෙස් දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් වෙත ලබා දී ඇත. දායකයා දිස්ත්‍රික් කාර්යාලය වෙත ලිපි ලේඛන භාරදුන් අවස්ථාවේදී එම දායකයා සඳහා අංකයක් ලබා දීමටත්, එම තොරතුරු ප්‍රධාන කාර්යාලයට එවීමට පෙර Google Drive හි යාවත්කාලීන කිරීමටත් උපදෙස් ලබා දී ඇත. මේ වන විට දිස්ත්‍රික් කාර්යාල මඟින් එම ක්‍රියාවලිය සාර්ථකව සිදු කරමින් පවතී. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවිය යුතු අතර ශුද්ධ වාර මුදල් ගෙවීම අප්‍රමාදව සිදු කළ යුතුය. |
| | (iv) පවතින දත්ත පද්ධතිය තුළ දායකයින් 871,425 ක් ලියාපදිංචි කර ඇති අතර 2022 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 60 සම්පූර්ණ වී සිටි දායකයින් 439,025 කින් දායකයින් 246,531 ක් දෙනෙකුට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවා නොතිබුණි. | වයස අවුරුදු 60 සම්පූර්ණ වන ගොවීන්ගේ නාම ලේඛන ඒ ඒ දිස්ත්‍රික් කාර්යාලවලට යැවීමට කටයුතු කරනු ලබන අතර, එම ලේඛන ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ලබාදී ඒ තුළින්ද, ගොවීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන අතර, ඉදිරියේදී පුවත්පත් දැන්වීම් හා ඍජු දැනුවත් කිරීම් මගින් මෙම තත්ත්වය මගහරවා ගැනීමට කටයුතු කරනු ලැබේ. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. |
| | (v) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමි වූ දින සිට විශ්‍රාම වැටුප සකස් කළ දිනය දක්වා වූ කාලයට අදාළ මුදල ගොවීන් වෙත ගෙවීමට කටයුතු නොකිරීම නිසා 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා හිඟ ගොවි විශ්‍රාම වැටුප් රු.3,914,947,932 ක් මූල්‍ය ප්‍රකාශනවල නිරවුල් නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් තිබුණි. | ඉදිරියේදී කිසිම හිඟ මුදලක් ඇති නොවන පරිදි විශ්‍රාම වැටුප් හිමිකම ලබන අවස්ථාවේදීම විශ්‍රාම වැටුප් ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ගෙවිය යුතුව පවතින හිඟ විශ්‍රාම වැටුප් ඉදිරියේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබාගෙන ක්‍රමිකව ගෙවීමට නියමිතය. | වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ගොවි විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. |
| (ආ) 12(ඇ) උප වගන්තිය | යෝජනාක්‍රමය සම්බන්ධයෙන් අවශ්‍ය මූල්‍ය හා මෙහෙයවීම් වාර්තා පවත්වාගෙන යා යුතු වුවත්, යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | යෝජනා ක්‍රමය මුල් වකවානුවේදී පරිගණක පද්ධතියක් පවත්වාගෙන ගොස් නොමැතිව වාරික සටහන් පොත් පවත්වා ගැනීම තුළින් වාරික ගෙවීම් හඳුනා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවේදයන් සකසා ඇත. වාරික අයවීමේ එෆ්.එස්.බී 5 කුවිතාන්සි | යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් අවශ්‍ය මූල්‍ය හා මෙහෙයවීම් වාර්තා පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වාර්තා දිස්ත්‍රික් කාර්යාලය තුළද පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. මෙම දුර්වලතාවයන් මගහරවා ගැනීම සඳහා නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට ක්‍රියාත්මක කර ඇත. | |
| (ඇ)12(ඇ) උප වගන්තිය | යෝජනාක්‍රමය පිළිබඳව සමීක්ෂණ ඇගයුම් හා සමාලෝචනය කර, මෙහෙයුම් රීතිවල වෙනස්කම් ඇති කිරීම සිදු කළ යුතු වුවත්, | | |
| | (i). සම්මත කරගන්නා ලද රීතියක් නොමැතිව අර්ධ වර්ෂයකට සියයට 3.32 ක ප්‍රතිශතයක් මත ශුද්ධ වාරික මුදල මත පොලිය ගණනය කර තිබුණි. | නිසි පරිදි දායක මුදල් ගෙවීම් නොකරන දායකයන්හට ශුද්ධ වාර මුදල් හා පොලිය ගෙවීම් සිදු කරන බව 1987 අංක 452/12 දරන ගැසට් පත්‍රයේ 13 වන නියෝග මගින් දක්වා ඇත. එම ගණනය කිරීම් ජීවගණිතඥයෙකු විසින් සිදු කර ඇත. | ශුද්ධ වාරික මුදල මත පොලිය ගණනය කිරීමට රීතියක් ගොඩනගාගත යුතුය. |
| | (ii) සම්මත කරගන්නා ලද රීතියක් නොමැතිව ප්‍රතිලාභියාගේ ශුද්ධ වාරික මුදල් ගණනය කිරීමේදී ඔහු විසින් ගෙවා ඇති සෑම එක් වාරිකයකින්ම රු.15 බැගින් වූ පරිපාලන වියදමක්, ගොවියා නිසි පරිදි ගෙවූ එක් වාරිකයකට රු.30 බැගින් රක්ෂණ ගාස්තුවක් ද ගණනය කරන ලද ශුද්ධ වාරික මුදලින් රු.150 ක රක්ෂණ ගාස්තුවක්ද අඩු කර තිබුණි. | පරිපාලන හා මෙහෙයුම් වියදම් වලින් යම් ප්‍රතිශතයක් අන්තර්ග්‍රහණය කර රක්ෂණ වාරික තීරණය කරනු ලබයි. මෙය රක්ෂණ ආයතනයන්හි සාමාන්‍ය ක්‍රමවේදයකි. ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, රාජ්‍ය සහනාධාරයන් පදනම්කර ක්‍රියාත්මක වූ බැවින් වාරිකය සඳහා ලාභාන්තිකයක් අන්තර්ගත කර නොමැත. දායකත්වයෙන් ඉල්ලා අස්වීමේදී හෝ ශුද්ධ වාරමුදල් ගණනය කිරීමේදී අදාළ වියදම් සඳහා යම් ප්‍රතිශතයක් අඩු කිරීම රක්ෂණ ක්‍රමවේදයේ අන්තර්ගත සාමාන්‍ය ක්‍රමවේදයකි. ඒ අනුව එම ගණනය කිරීම් සිදුකර ඇත. එසේ නොමැතිව ස්වයං මූල්‍ය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ නොහැක. | නීති රීතිවලින් ආවරණය නොවන අවකරණ සිදු නොකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ඇ) 15 වගන්තිය | 15(2) සිට 15(5) දක්වා වූ උප වගන්ති අනුව පිළිවෙලින් වාරික 5 ක් කඩ කිරීම පිළිබඳ දායකයින් දැනුවත් නොකිරීම වැනි කොන්දේසි මණ්ඩලය විසින් කඩ කිරීම නිසා ගොවීන්ට ප්‍රතිලාභ අහිමිවූ අවස්ථා නිරීක්ෂණය විය. | 15 වගන්තිය යටතේ වාරික ගෙවීම් පැහැර හැර ඇති දායකයින් වෙත සහන කාලයක් ලබාදීමේ හැකියාව මණ්ඩලය සතුව ඇත. ඒ අනුව විගණනය මගින් සිදුකර ඇති නිරීක්ෂණය පදනම්කොට ගෙන සම්පූර්ණයෙන් වාරික ගෙවා ඇති දායකයින් හට සහනකාලයක් ලබාදී දායකත්වය සක්‍රිය කර විශ්‍රාම වැටුප් හිමිකම් ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට අපේක්ෂා කෙරේ. | වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වීමට ඇති අවදානම පිළිබඳව දායකයා දැනුවත් කළ යුතුය. |
| | (ඉ)27(1) වගන්තිය | විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාවය මත, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතු වුවත් එවැනි එකඟතාවයක් ලබානොගෙන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රමයට ණය ලබාගෙන තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට එම ණය මුදල්වල ශේෂය රු.484,160,453 ක් බව නිරීක්ෂණය විය. | 2010 වර්ෂය වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදල ශූන්‍ය වීම නිසා 2010 හා 2011 වර්ෂවලදී ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා එම යෝජනා ක්‍රමයේ මුදල් නොමැති විය. ඒ අනුව මුදල් අමාත්‍යාංශය විසින් ලබාදුන් නිර්දේශ හා උපදෙස් වලට අනුව කෘෂි රක්ෂණ හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම තුළින් මුදල් ලබාගෙන ගෙවීම් සිදුකර ඇත. මෙම ලබාගත් මුදල් ණය මුදලක් ලෙස ගිණුම්ගත කර ඇති අතර, එම ණය මුදල් ක්‍රමිකව ප්‍රතිපූර්ණය කිරීමට කටයුතු කර ඇත. | විෂයභාර සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය මත, යෝජනා ක්‍රමය විසින් ලබා ගන්නා ණය ප්‍රමාණය තීරණය විය යුතුය. |
| **1.6.2** | ගොවි විශ්‍රාම වැටුප් සහතික ඔප්පුවේ 6 වගන්තිය | සහතික ඔප්පුවේ 6 වන වගන්තිය අනුව, ගෙවා ඇති අර්ධ වාර්ෂික දායක මුදල් ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් සියයට 75 ක් වෙතොත් දායක මුදල් ගෙවීමේ කාලය අවසන් වූ විට මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නියමිත විශ්‍රාම වැටුපට වඩා අඩු විශ්‍රාම වැටුපක් ලැබීමට දායකයාට හිමිකම් ඇතත් එය සැලකිල්ලට නොගෙන දායකයින්ගෙන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අහිමි කළ අවස්ථා නිරීක්ෂණය විය. | 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව පිළිවෙලින් වාරික 5 ක් ගෙවීම පැහැර හරින යම් දායකයෙකුට ඔහු වෙත නිකුත් කරන ලද සහතිකය යටතේ වූ ප්‍රතිලාභ අහිමි වේ. ඒ අනුව මෙම දායකයින් අනුගාමී වාරික 05 ගෙවීම පැහැර හැර ඇති බැවින් දායකත්වය අවලංගු වී ඇත. | වාරික මුදල් නිසිපරිදි නොගෙවීම මත ප්‍රතිලාභ අහිමි වී ඇති බව දායකයා දැනුවත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.192,873,887 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. රු.249,530,974 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.56,657,087 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පොලී ආදායමේ වැඩිවීමට සාපේක්ෂව ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් රු.145,157,212 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාස 6 ක් විශ්‍රාම වැටුප ලබා නොගත් විශ්‍රාම වැටුප් හිමියන්ගේ නම් මියගිය බව තහවුරු කර ගැනීමකින් තොරව විශ්‍රාම වැටුප් අංශයේ නිලධාරීන් විසින් විශ්‍රාම වැටුප් ගෙවීම් නාමලේඛනයෙන් ඉවත්කර තිබුණි. | ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය තැපැල් දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව සිදු කරනු ලබයි. දායකයා මියගිය අවස්ථාවන් වලදී අදාළ තැපැල් කාර්යාල මඟින් මියගිය දායකයන්ගේ තොරතුරු ලබා දෙනු ලබයි. දිගින් දිගටම විශ්‍රාම වැටුප් ලබා නොගන්නා විශ්‍රාම වැටුප්ලාභීන් පිළිබඳ අධ්‍යයනයක් සිදුකොට එම විශ්‍රාම වැටුප්ලාභීන් ගෙවීම් නාම ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | විශ්‍රාම වැටුප් නාමලේඛනයෙන් නම් ඉවත් කිරීමට පෙර මියගිය බව තහවුරු කර ගත යුතුය. |
| (ආ) | ගොවි විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සහ පරිපාලන වියදම් සඳහා මාසිකව මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාදෙන අතර එසේ තිබියදී ගොවීන් වෙත බෙලහීන සහ මරණ පාරිතෝෂික ගෙවීම සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය තුළ වාර්ෂිකව වාරික මුදලක් තැන්පත් කරමින් ගොවීන් රක්ෂණය කර රක්ෂණ අරමුදලක් ගොඩනගාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.17,197,260 ක වාරික මුදලක් බැර කර රු.1,173,625 ක මරණ පාරිතෝෂික ගෙවීම් සිදු කර තිබුණු අතර වර්ෂය අවසානයට එම අරමුදලෙහි ශේෂය රු.1,258,775,352 ක් විය. සෑම වර්ෂයකදීම ගෙවන ලද ප්‍රතිලාභය මෙම අරමුදලට වාර්ෂිකව බැරකරන වාරිකවලින් සියයට 5 සිට 10 තරම් අඩු ප්‍රමාණයක් බැවින් මෙම රක්ෂණය පවත්වාගෙන යාමෙහි ඵලදායීතාවයක් නොමැති බව නිරීක්ෂණය කෙරේ. | ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ආරම්භයේදී මරණ හා බෙලහීන පාරිතෝෂික ගෙවීම ක්‍රියාත්මක කිරීම සඳහා දායකයින්ට අදාළ වාරික මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ගෙවීම සිදුකරන ලද අතර, එම ගෙවන ලද වාරිකය මණ්ඩලය තුළ රඳවා ගනිමින් අරමුදලක් ගොඩනගා ගන්නා ලදී. විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ගෙවනු ලබන වාරිකය පිළිබඳ නැවත සමාලෝචනයක් කිරීමට අපේක්ෂා කෙරේ. | රක්ෂණය පවත්වාගෙන යාමේ ඵලදායීතාවය සමාලෝචනය කළ යුතුය. |
| (ඇ) | යෝජනාක්‍රමය යටතේ දායකත්වය ලබාගෙන සිටින ගොවි දායකයින්ගේ ජීව දත්ත තොරතුරු ලබාගෙන, | ගොවියා වෙත ලබා දෙනු ලබන වාරික සටහන් පොත්වල තොරතුරු සමීක්ෂණය මඟින් එක්කොට පිටපත් ලබා ගැනීම සඳහා කටයුතු | තොරතුරු පද්ධතිය යාවත්කාලීන කර |

| | | |
|---|---|---|
| තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහයෝගය සහිතව 2017 අගෝස්තු 11 දින වන විට රු.5,640,925 ක් වැයකර ලබා ගත් තොරතුරු අපේක්ෂිත තොරතුරුවලින් සියයට 20 කට වඩා අඩු ප්‍රමාණයක් නිසා එම තොරතුරු පදනම් කරගෙන පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණු නිසා අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | සිදු කළ ද අදාළ සමීක්ෂණ කටයුතු මගින් තොරතුරු ලබා ගැනීම ඉතා දුෂ්කර වීම නිසා අපේක්ෂිත ලෙස තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. | අපේක්ෂිත අරමුණ ඉටු කරගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දායකයන් විසින් ගෙවනු ලබන වාරික පවත්නා තොරතුරු පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණු නිසා සහ ලදුපත් පරීක්ෂා කළ හැකි ලෙස ආරක්ෂිතව ගබඩා කිරීමකින් තොරව ඉවත දමා තිබීම නිසා පහත අඩුපාඩු නිරීක්ෂණය විය.<br>(i). “නිසි පරිදි ගෙවූ වාරික” ගණනය කිරීමට නොහැකි විම.<br>(ii). සියලුම වාරික මුදල් ගෙවා තිබේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වීම.<br>(iii). විශ්‍රාම වැටුප ඉල්ලූ දායකයන් ළඟ ඇති වාර මුදල් සටහන් පොතෙහි දායක මුදල ගෙවූ දිනය හෝ මුල් කුවිතාන්සි පිටපත් ලබාගෙන දායක ලැබීම් තොරතුරු තහවුරු කර ගැනීමට සිදුව තිබීම.<br>(iv). පිළිවෙලින් වාරික 5 ක් කඩ කිරීම පිළිබඳ දායකයින් දැනුවත් කිරීමට නොහැකි වීම.<br>(v). මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දායකත්ව ආදායමෙහි සම්පූර්ණත්වය සහ නිවැරදිභාවය ගිණුම් තැබීමේදී හා විගණනයේදී තහවුරු කර ගත නොහැකි වීම.<br>(vi). වාරික මුදල් ආදායම උපචිත පදනමට ගිණුම්ගත කිරීමට නොහැකි වීම.<br>(vii). මාසික සහ අර්ධ වාර්ෂික වාරික ගෙවනු ලබන ගොවීන් විසින් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප සඳහා ඉල්ලීම් කරනු ලබන තුරු, විශ්‍රාම වැටුප ගණනය කිරීමට මණ්ඩලයට තොරතුරු නොමැති වීම. | මෙම දුර්වලතාවයන් මගහරවා ගැනීම සඳහා නව පරිගණක දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට ක්‍රියාත්මක කර ඇත.<br>පැවති සේවක හිඟය මත පසුවාරික පරිගණකගත කිරීම සිදු කිරීමට නොහැකි වූ අතර 2022 වර්ෂයේ සිට නැවතත් පසුවාරික පරිගණකගත කිරීම ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | වාරික මුදල් ලැබීම් තොරතුරු යාවත්කාලීනව මණ්ඩලය තුළ පවත්වාගෙන යමින් විශ්‍රාම ප්‍රතිලාභ හිමි දායකයින්ට අප්‍රමාදව ප්‍රතිලාභ ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (viii). ග්‍රාමීය බැංකු සහ විවිධ සේවා සමුපකාර සමිති වැනි නියෝජිත ආයතනවලින් සහ දිස්ත්‍රික් කාර්යාලවලින් අයකරන වාරික මුදල් ප්‍රේෂණය කිරීමට ප්‍රමාද වන අවස්ථාවලදී එය හඳුනා ගැනීමට නොහැකි වීම. | | |
| (ආ) | නව ගොවි විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනාක්‍රමයක් ආරම්භ කර වසර 1½ ක් ගතවී, නව දායකයින් 485 ක් යෝජනාක්‍රමයට දායකත්වය ලබාගෙන ඇතත් නිසි පරිදි වාරික ගෙවා නොමැති දායකයින් හඳුනාගෙන දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නව බඳවා ගැනීම් පිළිබඳ දත්ත තාවකාලිකව පිළියෙල කර ඇති තොරතුරු පද්ධතියට ඇතුළත් කර ඇත. වාරික ගෙවනු නොලබන ගොවි මහතුන්හට ඉදිරියේදී SMS පණිවුඩ හරහා දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | නිසි පරිදි වාරික ගෙවා නොමැති දායකයින් හඳුනාගෙන දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය. |